The Employers' Federation of Ceylon යන්න සඳහා වර්තමානයේදී නිල වශයෙන් භාවිතා වන නාමය වන්නේ සේවා සම්මේලනය යන්නයි. කෙසේ නමුත් අතීතයේදී ඒ සඳහා භාවිතා වූයේ ශ්‍රී ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය බව අප කළ විමසුමකදී ඔවුන් ප්‍රකාශ කරන ලදී. මෙහිදී අපට ඇසීමට ඇත්තේ එක් පැනයකි. 'හාම්පුතුන්ගේ සම්මේලනය' යන්න යම් කිසි ආකාරයකින් ගැටළුකාරී වේ යැයි ඔබ සිතන්නේද?

ඒ ඔස්සේ වර්තමානයේ පවත්නා සේවක-සේවායෝජක සම්බන්ධතාවයට වඩා වෙනස් ආකාරයක වූ ස්වාමි-සේවක සම්බන්ධතාවයක් හැඟවෙන්නේ යැයි ඔබ සිතන්නේද? එසේත් නැතිනම් නිල වශයෙන් භාවිතා විය යුතු නාමය ශ්‍රී ලංකා සේවා සම්මේලනය වුවත්, හාම්පුතුන්ගේ සම්මේලනය යන පැරණි නාමයද ජනමාධ්‍ය මගින් යොදාගැනීමේ අනුචිත බවක් නැතැයි ඔබ සිතන්නේද? මේ විවෘත සංවාදයක් සඳහා වන ප්‍රවේශයක් බව සලකන්න.

#MediaEthicsSL #lka #SinhalaPress #News #Aruna